රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/2004

මගේ අංකය:ආ/7/5/1/100
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2004 අගෝස්තු මස 18 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## <u>ප්‍රසූති නිවාඩු - ආයතන සංග්‍රහයේ **XII** පරිච්ඡේදය</u>

රජයේ නිලධාරිනීන්ට සෑම දරු උපතක් සඳහාම දින 84 ක ප්‍රසූති නිවාඩු ලබාදීමට රජය තීරණය කර ඇත. එබැවින් ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 18 වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය 2004.06.23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආදේශ කරනු ලැබේ.

18. <u>ප්‍රසූති නිවාඩු :</u>

18:1 ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී නිලධාරිනීන්ට මෙම වගන්තිය යටතේ ප්‍රසූති නිවාඩු හිමිවේ.

18:2 නිලධාරිනියකට සෑම සජීවී දරු උපතක් සඳහාම රජයේ වැඩ කරන දින 84 ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් හිමිවේ. දරු ප්‍රසූතිය සිදුවී සති 04ක් යාමට මත්තෙන් නිලධාරිනියට යළිත් රාජකාරි භාර ගැනීමට ඉඩ නොදෙනු ඇත. මෙම වගන්තිය යටතේ නිවාඩු ලබා ගැනීම සඳහා වෛද්‍ය සහතිකයක් හෝ දරුවාගේ උප්පැන්න සහතිකය හෝ ඉදිරිපත් කළ යුතුය.

18:3 ප්‍රසූති නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලය තුළට පැමිණෙන රජයේ නිවාඩු, සෙනසුරාද සහ ඉරිද දින ඊට ඇතුළත් නොකළ යුතුය.

18:4 මෙම නිවාඩු කාලය නිලධාරිනියගේ ඉතිරිව තිබෙන නිවාඩුවලින් අඩු නොකළ යුතු අතර, මෙම නිවාඩු කාලය සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ලෙසට සැලකිය යුතුය.

18:5 උපතේදීම මරණය සිදුවන දරු උපතකදී සහ දරු ප්‍රසූතියෙන් සති 6 ක් ඉක්මයාමට මත්තෙන් දරුවා මරණයට පත්වන අවස්ථාවකදී දරුවාගේ මරණ සහතිකය හෝ වෛද්‍ය සහතිකය හෝ ඉදිරිපත් කළවිට විශේෂ වැටුප් සහිත නිවාඩු වශයෙන් දරු උපත සිදුවූ දින සිට සති 6 ක නිවාඩුවක් දිය යුතුය.

18:6 ගබ්සාවීමක් නිසා නිවාඩු වෛද්‍ය සහතිකයක් මත නිලධාරිනියට හිමි විවේක නිවාඩුවලින් ලබාගත හැක.

18:7 අනුමත දින 84 ක ප්‍රසූති නිවාඩු කාලය අවසන් වීමෙන් අනතුරුව තම දරුවාට මව්කිරි දීම සඳහා සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිටවන වේලාවට පැයකට කලින් සේවා ස්ථානයෙන් පිටත්ව යාමට ඔවුනට අවසර දිය යුතුය. මෙම අවසරය දිය යුත්තේ දරුවාට වයස මාස 6 ක් (හයක්) සම්පූර්ණ වනතුරු පමණි.

තවද නිලධාරිනියකට ගර්භනී අවස්ථාව මාස 5 ක් වූ විට රාජකාරි සඳහා සේවා ස්ථානයට පැය භාගයක් ප්‍රමාදවී පැමිණීමට ද සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිටවන වේලාවට පැය භාගයකට ප්‍රථම පිටවීමට ද ඉඩ දෙනු ලැබේ. මෙම අනුග්‍රහය දෙනු ලබන්නේ නිලධාරිනිය ප්‍රසූති නිවාඩු ලබා ගන්නා තෙක් පමණි.

02. 2004.06.23 දින සිට 1996.06.17 සහ 1997.11.08 දිනැති අංක 16/96 සහ 16/96(1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අවලංගු වේ.

03. 1999.07.20 දිනැති අංක 16/99 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 18:8:1 උපවගන්තියද පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

18:8:1 සියළුම රාජ්‍ය නිලධාරිනීන්ට, අභ්‍යාසලාභිනීන්ට 18:2 උපවගන්තිය යටතේ අනුමත කරන ලද නිවාඩු අවසන්වීමෙන් පසු, මෙහි (අ) සහ (ආ) සඳහන් කරුණු සම්පූර්ණ වන අවස්ථාවලදී ඇයගේ සේවා කාලය තුළ දරු උපතකට උපරිම වශයෙන් මාස 06 ක කාලයක වැටුප් රහිත ප්‍රසූත (විශේෂ) නිවාඩු ලබාදිය හැකිය.

(අ) උපතේදීම දරුවා අසාමාන්‍ය තත්ත්වයක සිටි බව ප්‍රසව හා නාරි රෝග පිළිබඳව රජයේ වෛද්‍ය විශේෂඥයකු සහතික කොට ඇත්නම්, එවැනි දරුවන් සම්බන්ධව ලබාගත් සාමාන්‍ය ප්‍රසූත නිවාඩු අවසන්වන අවස්ථාවකදී එම ළදරුවා තවදුරටත් අසාමාන්‍ය තත්ත්වයක සිටින බව හා ඒ නිසා මවගේ විශේෂ පෞද්ගලික රැකවරණය හා අවධානය එම දරුවාට තවදුරටත් අවශ්‍ය බව රජයේ ළමා රෝග වෛද්‍ය විශේෂඥයකු සහතික කරන අවස්ථාවක,

(ආ) දරුවාගේ උපත නිසා වෙනත් රෝගාබාධ ඇතිවීමේ හේතුවෙන් මවට තවදුරටත් විවේකය අවශ්‍ය වන බව ප්‍රසව හා නාරි රෝග පිළිබඳව රජයේ විශේෂඥ වෛද්‍යවරයකු සහතික කරනු ලබන අවස්ථාවක.



එස්.සී.මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය